2023 මැයි

**ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය ‘ආගන්තුකයෝ’ විවෘතකරයි**

ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය ‘ආගන්තුකයෝ’ ලෙස නම් කෙරුණු සිය නව ප්‍රදර්ශනය 2023 මැයි 4 වැනිදා, කොළඹ 3, ක්‍රෙස්කැට් බූලෙවාර්ඩ්හි බිම් මහලේ පිහිටි කෞතුකාගාර පරිශ්‍රයේදී විවෘතකළේ ය. සන්දේව් හැන්ඩි සහ ශාර්මිණී පෙරේයිරා විසින් අභිරක්ෂණයකර ඇති ‘ආගන්තුකයෝ’, විදේශිකයන්, පිටස්තරයන්, හෝ අතිචාරීන් ලෙස ආගන්තුකබව ඔවුන් මත සළකුණුකර ඇති විකාරරූපී ආකාර ආමන්ත්‍රණයකිරීමට විවිධ මාධ්‍ය භාවිතකරන සමකාලීන කලාකරුවන් 15 දෙනෙකුගේ කලාකෘති එකට එක්කරයි. අන්‍යත්වය වර්ගකරන සහ ආගන්තුකබව දකින යල්පැනගිය ආකාරවලට විරෝධය පෑමට, ඒවා නැවත පරිකල්පනයකිරීමට, සහ මිශ්‍රකිරීමට මෙම කලාකෘති එක්වෙයි. මෙම කලාකෘති අතර ඡායාරූප, අභිවහන, වීඩියෝ කලාකෘති, ස්ථාපන, චිත්‍ර, සහ සිතුවම් ඇතුළත් වේ.

මෙම ප්‍රදර්ශනය ජොනතන් එඩ්වඩ් විසින් විශේෂයෙන් නිර්මාණයකර ඇති අතර ප්‍රදර්ශන අනන්‍යතාව එමිල් මොලින් විසින් නිර්මාණයකර ඇත. ප්‍රදර්ශනය පිළිබඳ අදහස් දක්වමින් එහි නියමු අභිරක්ෂක සන්දේව් හැන්ඩි සඳහන්කළේ, “සමකාලීන කලාකරුවන් නිවස, සීමා, සහ අයිතියාව පිළිබඳ පරස්පර විරෝධී අදහස් සමග නිතර පොරබදන්නේ කෙසේදැයි යන්න ‘ආගන්තුකයෝ’ ප්‍රදර්ශනය සළකාබලනවා. දේශීය සහ විසරිත හඬවල් ඔවුන්ගේ ස්ථානීය අත්දැකීම් සහ අවතැන්වීම පිළිබඳ සාක්ෂි දැරීමට එකට එක්වන, සංකීර්ණ ස්වර විරෝධයක් ලෙස අපි මෙම ප්‍රදර්ශනය පරිකල්පනය කරන්නේ නරඹන්නන්ට ඒවාට සවන්දීමට, සුසරකිරීමට සහ, විචාරයකිරීමට ආරාධනා කරමින්” යනුවෙනි. වැඩිදුරටත් අදහස් දැක්වූ ඔහු, “බලවත් සංස්කෘතික ආඛ්‍යාන විසින් අප මත බොහෝ විට පනවන සීමා විචාරශීලීව පරික්ෂාකිරීමට, ප්‍රශ්නකිරීමට, හෝ කඩාබිඳ දැමීමට පවා අපට උපකාරිවන වැදගත් කලාත්මක හඬවල් ලෙස විදේශිකයාගේ, පිටස්තරයාගේ, සහ ආගන්තුකයාගේ අත්දැකීම් හඳුනාගැනීමට අපි පටන්ගන්නා තැන මෙම ප්‍රදර්ශනය වීම මගේ බලාපොරොත්තුවයි” යැයි කීවේ ය.

අර්ජුන ගුණරත්න (උ. 1976), ධනුෂ්ක මාරසිංහ (උ. 1985), දිනෙල්ක ලියනගේ (උ. 1994), හේමා ශිරෝණි (උ. 1991), හානියා ලුතුෆි (උ. 1989), ඉමාද් මජීඩ් (උ. 1991), ඉසුරු කුමාරසිංහ (උ. 1987), ජනනි කුරේ (උ. 1974), කේ කේ ශ්‍රීනාත් චතුරංග (උ. 1987), නීනා මංගලනායගම් (උ. 1980), රෙජිනෝල්ඩ් එස්. ඇලෝසියස් (උ. 1970), එස්. එච්. හේරත් (උ. 1947), ශ්‍යාමා ගෝල්ඩන් (උ. 1983), ස්ටීවන් චැම්පියන් (උ. 1959), සහ සුමුදි සුරවීර (උ. 1982) යන සමකාලීන කලාකරුවන් 15 දෙනා ‘ආගන්තුකයෝ’ ප්‍රදර්ශනයේ ඇතුළත් වේ. ඉන් කලාකෘති දෙකක්වන Musicmattersහි දිනෙල්ක ලියනගේ (උ. 1994), හානියා

ලුතුෆි (උ. 1989), සහ සුමුදි සුරවීර (උ. 1982) විසින් කළ 'வாசல்/ එළිපත්ත/ Threshold (Part 1)' සහ 'வாசல்/ එළිපත්ත/ Threshold (Part 2)' යන ඒවා, 2021දී යුරෝපා සංගමයේ සහය ඇතිව MMCA ශ්‍රී ලංකා විසින් පැවරූ නිර්මාණ ය. ප්‍රදර්ශනයට කලාකෘති කුලියට දෙන්නන් ඉන්දියාව, ශ්‍රී ලංකාව, ස්වීඩනය, එක්සත් රාජධානිය, සහ ඇමරිකා එක්සත් ජනපදය යන රටවල් පාදකකරගෙන සිටියි.

ප්‍රදර්ශනය පිළිබඳ අදහස් දක්වමින් MMCA ශ්‍රී ලංකාහි ප්‍රධාන අභිරක්ෂක ශාර්මිණී පෙරේයිරා සඳහන්කළේ, "'ආගන්තුකයෝ' ප්‍රදර්ශනය ශ්‍රී ලංකාවේ, එක්සත් ජනපදයේ, ස්වීඩනයේ, සහ එක්සත් රාජධානියේ ජීවත්වන සහ වැඩකරන සමකාලීන කලාකරුවන්ගේ නිර්මාණ පිළිබඳ අවබෝධයක් කෞතුකාගාරයේ නරඹන්නන්ට ලබාදෙනවා. අපගේ කාර්යයේ වැදගත් ම අංශයක්වන්නේ දැනට ජීවත්වන කලාකරුවන්ගේ කලාකෘතිවලට සහය දැක්වීම සහ ඒවා ප්‍රදර්ශනයකිරීමයි. එය නූතන කලාකරුවන්ගේ පරම්පරාවට නොලැබෙන අවස්ථාවක්," යනුවෙනි. ඇය තවදුරටත් කීවේ, "අපි කවුද සහ අපි කොහෙන් පැමිණියේ ද යන්න පිළිබඳ බොහෝ සමකාලීන ගැටළු ස්පර්ශකර ඇතැයි අපි විශ්වාසකරන ප්‍රදර්ශනයකට නරඹන්නන් පිළිගැනීමට අපි බලාපොරොත්තු වෙනවා" යනුවෙනි. "රටේ සමකාලීන කලාකරුවන් වෙත ජාත්‍යන්තර අවධානය යොමුකරවීමට අපේක්ෂාකරන, ශ්‍රී ලංකාවෙන් පිටත වෙසෙන පුද්ගලයින් පිරිසකගේ සහයෝගය ලැබෙන අපගේ ප්‍රථම ප්‍රදර්ශනය ද මෙයයි. තව ද, ඔවුන්ගේ මෙම ආදර්ශය ගෙන ඒ හා සමානව සමකාලීන කලාවේ පර්යේෂණ සහ අභිරක්ෂණය සඳහා අනෙක් පුද්ගලයන් ද තම සහයෝගය ලබාදෙනු ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා" යැයි ද පෙරේයිරා සඳහන්කළා ය.

MMCA ශ්‍රී ලංකා සිය නරඹන්නන් හට 'ආගන්තුකයෝ' ප්‍රදර්ශනයට සමගාමීව මහජන වැඩසටහන් රාශියක් ද නොමිලේ ලබාදෙනු ඇත. මෙම වැඩසටහන් අතරට කලාකරුවන් සහ ශාස්ත්‍රඥයින් සමග ගැලරි කතා, කලා වෘත්තිකයන් සහ විද්වද්වෘත්තිකයන් විසින් පවත්වනු ලබන වැඩමුළු, මගපෙන්වූ අභිරක්ෂක සංචාර සහ ප්‍රදර්ශන සංචාර, කවි සමාජයක්, අභිවහන, සහ අනෙකුත් විශේෂ වැඩසටහන් ද ඇතුළත් වේ. සියලු ම මහජන වැඩසටහන් යුරෝපා සංගමයේ නිර්ලෝභී සහයෙන් සිදුකෙරෙන අතර, 'ආගන්තුකයෝ' ප්‍රදර්ශනය සඳහා අනෝජි අමරසිංහ, හියු මර්ෂාන්, රධිකා චොප්‍රා, සහ රාජන් ආනන්දන්ගේ කාරුණික සහයෝගය මෙන් ම MMCA ශ්‍රී ලංකාහි ආදිකර්තෘ අනුග්‍රාහකයන්ගේ, බ්‍රිතාන්‍ය කවුන්සිලයේ, සහ Lite87හි අමතර සහයෝගය ද ලැබෙයි. කෞතුකාගාරයේ ප්‍රධාන පරිත්‍යාගශීලීන් සහ අරමුදල් සපයන්නන්වන ජෝන් කීල්ස් පදනම, නේශන්ස් ට්‍රස්ට් බැංකුව, සහ ෆෙයාෆස්ට් රක්ෂණ ආයතනය ද ඔවුන්ගේ නිර්ලෝභී සහයෝගය ලබාදෙයි.

ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය (MMCA ශ්‍රී ලංකා) යනු සාමාන්‍ය ජනතාව, පාසල්, මෙන් ම සංචාරකයන්ගේ ද ප්‍රයෝජනය හා රසවින්දනය සඳහා නූතන සහ සමකාලීන කලා කෘති ප්‍රදර්ශනය, පර්යේෂණය, රැස්කිරීම, සහ සංරක්ෂණය වෙනුවෙන් කැප වූ පොදු කෞතුකාගාරයක් පිහිටුවීම අරමුණු කරගත් අධ්‍යාපනය පෙරටුකරගත් මුලපිරීමකි. කෞතුකාගාරය දිනපතා (පෝය සහ මහජන නිවාඩු දිනවල හැර) පෙ.ව. 10–ප.ව. 6 දක්වා කොළඹ 03, ක්‍රෙස්කැට් බූලෙවාර්ඩ්හි බිම් මහලේ විවෘතව ඇති අතර, කෞතුකාගාරයට ඇතුළුවීම සහ එහි සියලු ම මහජන වැඩසටහන් නොමිලේ ය. කෞතුකාගාරය සහ, එහි ප්‍රදර්ශන හා මහජන වැඩසටහන් පිළිබඳ තොරතුරු ඔවුන්ගේ වෙබ් අඩවියෙන් www.mmca-srilanka.org/ හෝ

ෆේස්බුක් facebook.com/mmcasrilanka සහ ඉන්ස්ටග්‍රෑම් instagram.com/mmcasrilanka/ පිටුවලින් ලබාගත හැක.